# ජනවාර්ගික අර්බුදය සම්බන්ධව ජනමාධ්‍ය හැසිරීම හා ක්‍රියාකාරිත්වය පිළිබඳ අධ්‍යයනයක්


ඒ.ආර්.ඩී.රාජනායක

FGS/03/02/06/2007/02



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 984 |
| වර්ග අංකය: | |


**කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ ජනසන්නිවේදනය පිළිබඳ දර්ශනපති (Mphil) උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.**

**2012 ජනවාරි**

# සාරාංශය

ශ්‍රී ලංකාවේ ඓතිහාසිකව සිංහල හා දෙමළ ජාතීන් අතර රාජ්‍ය පාලනය (Governance) හා බලය අත්පත් කරගැනීමේ (Secure Power) කාර්යයේදී ගැටුම් (Conflicts) වාර්තා වේ. පසුකාලීනව විධිමත් පාලන රටාවක් (Formal governing system) සඳහා අනුගත වූ අවධියේ දී පවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ (Constitutional Reforms) හා දේශපාලන තීන්දු තීරණයන් (Political decision/ Politically made judgments) ජාතීන් අතර දූරස්ථභාවය (Distance between the nations) හා ගැටුම් තීව්‍ර වීම (Conflicts being serious) සඳහා බලපාන ලද බව පැහැදිලි කරුණකි. ඒ ඒ ජාතීන් තමන්ගේ ජාතිකත්වය (Nationality) වෙනුවෙන් පෙනී සිටීම හැර පොදු ශ්‍රී ලාංකීය ජාතිය (Sri Lankan Nation) යන සංකල්පය තුළ ක්‍රියා නොකිරීම කැපී පෙනුණු කරුණක් විය. ඒ සඳහා වගකිව යුතු සමාජ සංස්ථා හා ආයතනයන්ගේ හැසිරීම වගකීම් විරහිතව (Irresponsible behaviour of the society) සිදුවිය.

1983 කාලවකවානුව වනවිට වඩා විශාල ප්‍රේක්ෂක සංඛ්‍යාවක් ආමන්ත්‍රණය කළ හැකි හා පොදු මහජනතාවට වැඩි වශයෙන් බලපෑමක් කළහැකි ජනමාධ්‍යක් (Mass media) බවට පුවත්පත් මාධ්‍ය (Newspaper media) පත්ව තිබුණි. රජයේ හමුදා (Government Forces) හා උතුරේ ත්‍රස්තවාදී කණ්ඩායම් (Terrorist Groups) සමඟ ඇති වූ ගැටුම් වාර්තා කිරීමේ දී රාජ්‍ය හා පුද්ගලික පුවත්පත් ආයතන (State & Private owned newspaper organizations) ක්‍රියාකර තිබුණේ අතිශයින්ම වගකීම් විරහිතව (Irresponsibility) බව මෙම පර්යේෂණය පැහැදිලි කරයි. ගැටුම් අවම කරමින් ජාතීන් අතර සුහදතාව හා අන්‍යෝන්‍ය විශ්වාසය (Friendliness and confidence between nations) ගොඩනැංවීම සඳහා මාධ්‍ය වෙත පැවරුණු වගකීම පැහැර හැරීම නිසා අතිශයින් විනාශකාරී යුද්ධයක් (War) දක්වා එය වර්ධනය කිරීමට මාධ්‍ය ඉවහල් වූ බවට මෙම පර්යේෂණය සාක්ෂි දරයි.

යුද ගැටුම් උත්සන්න වූ 1983 ජූලි මසට පෙර හා පසු කාලවකවානුවල පුවත්පත් මාධ්‍ය වාර්තාකරණය (Reporting) පිළිබඳ අධ්‍යයනය, විද්වතුන් (Intelectuals) හා පුවත්පත් කතුවරුන්ගේ (Editors of the papers) මත, මහජන අදහස් (Public ideas) පිළිබඳ අධ්‍යයනය කරමින් මෙම පර්යේෂණය සිදුකර තිබේ.

ගැටුම් සංවේදී මාධ්‍යකරණය, (Conflict sensitive reporting) යුද හා සාම මාධ්‍යකරණය (War and peace reporting) පිළිබඳ අවබෝධයකින් යුක්තව වෘත්තීය මට්ටමින් ගැටුම් වාර්තා කිරීමේ පිළිවෙතක් මාධ්‍යකරුවන් විසින් අනුගමනය කරන ලද්දේ නම් ජාතික ඒකාබද්ධභාවයක් (National reconciliation) ගොඩනැංවීමේ විශාල කාර්යභාරයක් ඉටුකිරීමට පුවත්පත්වලට හැකියාව තිබුණි.